**නාමල්ඔය ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 වැනි දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 03 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජනවාරි 06 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව නොවීම.

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීඒ/ශ්‍රීලරාඅගිප්‍ර දරන පලාත් පාලන සහ පලාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොල්වත්ත සිකුරාදා සතිපොළ බදු දීම වෙනුවෙන් 2010 වසර සඳහා අයවිය යුතු හිඟ බදු කුලී රු.15,008 ක මුදල ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ 301 වැය ශීර්ෂය යටතේ වැටුප් හා දීමනා වියදම රු.1,206,770 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවලට **ගෙන තිබුණේ** රු. 1,196,770 ක් ලෙසය. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු. 10,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) නෙල්ෂිප් ව්‍යාපෘතිය මඟින් කරන ලද ඉදිකිරීම් වෙනුවෙන් සිදු කළ ගෙවීම් වලින් රඳවාගත් මුදල් රු.1,811,108 ක් ගිණුම්වල දක්වා නොතිබුණි.

## 1.3.3 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| **(අ) ප්‍රාදේශීය සභා රීති මාලාව** | |
| (i) රීති - 62 | සභාව විසින් පනවන ලද කර්මාන්ත බද්ද ගෙවන ලෙස නියම කරමින් පී.එස්.26 බී ආකෘති පත්‍රය ප්‍රකාර නිවේදනයක්, කර්මාන්ත බදු වාර්තා ලේඛනයෙහි නම් සඳහන් පුද්ගලයන් වෙත යැවිය යුතු නමුත් ලේකම්වරයා විසින් කර්මාන්ත බද්ද ගෙවන ලෙස නිවේදන නිකුත් කර නොතිබුණි. |
| (ii) රීති - 180 | මුදල්, ගබඩා හා ආදායම් එකතු කිරීමේ කටයුතු භාරව ක්‍රියා කරන නිලධාරීන් විසින් ඉදිරිපත් කළ යුතු ඇපකර ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) රීති - 203 | දේපල සමීක්ෂණය කිරීම සඳහා සභාවේ නියෝජිතයකුද ඇතුලත් වන පරිදි සමීක්ෂණ මණ්ඩලයක් පත්කල යුතු වුවද සභාවේ නියෝජිතයෙකු නොමැතිව සමීක්ෂණ මණ්ඩල පත්කර තිබුණි. |

| | |
|---|---|
| (iv) රීති - 218 | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂක මණ්ඩලයක් මඟින් පරීක්ෂා කලයුතු වුවත් සභාව සතු රු.14,125,435 ක ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) **<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>** | |
| i. මු.රෙ.571 | වර්ෂ 03 කට අධික කාලයක් තිස්සේ ඉදිරියට ගෙන එමින් තිබූ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.12,215 ක් අම්පාර ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු රු.30,000 ක් හා නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත ගෙවිය යුතු රු.2,298 ක් වූ පොදු තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. |
| ii. මු.රෙ. 1646 | සභාව විසින් භාවිතා කරනු ලබන රථ වාහන 08 කට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) **<u>PF 434 අංක දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය</u>** | රජයේ රක්ෂණ ආයතනයකින් රථ වාහන රක්ෂණය කල යුතු වුවද සභාවේ කැබ් රථයක් රු.86,564 කට පලාත් පාළන සහකාර කොමසාරිස්තුමාගේ ලිඛිත නිර්දේශය සහ සභාවේ අනුමැතිය යටතේ පෞද්ගලික ආයතනයකින් රක්ෂණය කර තිබුණි. |

## 2. මුල්‍ය සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති ආදායම් සහ වියදම් ගිණුමට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශිය සභාවේ වැඩ කටයුතු වල මුල්‍ය ප්‍රතිඵලය රු.406,615 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් වූ අතර, එයට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලය රු.12,730 ක ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදමක් විය. ඒ අනුව මුල්‍ය ප්‍රතිඵලයේ රු.419,345 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 10,000 | 39,360 | - |
| (ii) | කුළී | 921,540 | 739,867 | 25,799 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 357,300 | 251,400 | - |
| (iv) | සේවා සඳහා ගාස්තු | 80,250 | 66,944 | - |
| (v) | වරෙන්තු ගාස්තු හා දඩ | 706,500 | 994,957 | 498,203 |
| (vi) | වෙනත් ආදායම | 453,500 | 174,618 | - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් මෙහෙයුම් අකාර්යක්ෂමතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණු කැබ්රථ දෙකක, ට්‍රැක්ටර් තුනක, ටේලර් දෙකක අයිතිය වෙනත් ආයතනවල නම් වලින් පවතින අතර ඒවායේ අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) ප්‍රචාරක දැන්වීම් සහ බැනර් වලින් ආදායම් අයකර ගැනීම සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා අනුමත කරගෙන නොතිබීම නිසා එම ආදායම් මාර්ගය මඟින් වර්ෂයකට උපයාගත හැකි රු.30,000 කට අධික ආදායමක් සභාවට අහිමි වී ඇත.

(ඇ) ප්‍රදේශීය සභාවට අයත් මර්ග පිළිබඳ තොරතුරු ඇතුලත් ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. එම නිසා මාර්ග නඩත්තුව හා සංවර්ධනය පිළිබඳව ඇගයීමක් සිදු කිරීම දුෂ්කර විය.

(ඈ) බැංකු ගිණුමකට අදාලව බැංකුව විසින් වසර දහයකට පෙර වැරදීමකින් හර කරන ලද රු.23,000 ක මුදල  අයකර ගැනීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයන් හි අස්ථානගත වූ පුස්තකාල පොත් 1247 න් වටිනාකම හඳුනාගත් පොත්වල වටිනාකම රු.121,296 ක් වූ අතර, අස්ථානගත වීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි.

(ඊ) 2011 වර්ෂයට පෙර සභාවට ලැබුණු රු.1,000 ක් සඳහා සභාවේ නිලධාරියෙකු විසින් ලදුපත් නිකුත් කර තිබුණද එම මුදල බැංකුගත කර නොතිබීම සම්බන්ධයෙන්ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය.

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් පැවති බැවින් විධිමත් පාලන කාරකයක් ලෙස අයවැය ලේඛණය සඵල කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන.

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන සම්බන්ධ ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් පාලනය

(ඇ) ආදායම් අයකර ගැනීම